සැකසුම : සරසි පීරිස්-රත්නපුර අධ්‍යාපන කලාපය-සෞන්දර්ය අංශය

නිපුණතාව 2.0 නාට්‍ය හා රංග කලාව විෂය පිළිබඳ න්‍යායාත්මක පදනම ප්‍රගුණ කරයි

නිපුණතා මට්ටම 2.3 ප්‍රධාන රංග ශෛලි වල වෙනස්කම් හදුනාගනි

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ලෝක ධර්මී නාට්‍ය අතරින් වැරදි ප්‍රකාශය වන්නේ
   i. නළු නිළියන් ස්වභාවික ලෙස හැසිරේ
   ii. ලෝකයේ පැවැත්මට සමාන ලෙස නාට්‍ය රඟ දක්වයි
   iii. ස්වභාවික අභිනයෙන් යුක්ත වේ
   iv. අංග රචනය ස්වභාවිකත්වය ඉක්මවා ඇත

2. නාට්‍ය ධර්මී නාට්‍ය සඳහා වඩාත් යෝග්‍ය පිළිතුර කුමක්ද
   i. ස්වභාවිකත්වයෙන් ඈත් වූ රඟපෑම් වලින් යුක්ත වේ
   ii. අංගචලන ස්වභාවිකත්වයට ළඟින් නිරූපණය වේ
   iii. අංග රචනය සාමාන්‍ය වේ
   iv. තල මල පිපිලා ,සිංහබාහු ,මනමේ නාට්‍යධර්මී නාට්‍ය වලට නිදසුන් වේ

3. නාට්‍ය ධර්මී නාට්‍ය සම්බන්ධව වැරදි ප්‍රකාශය කුමක්ද
   i. පසුතල නිර්මාණ වලින් තොරය
   ii. අතිශයෝක්තියෙන් රඟදක්වයි
   iii. සියලු අභිනයන් අලංකාරව අතිශයෝක්තියෙන් ඉදිරිපත් කරයි
   iv. ගීත හා දෙබස් භාවිතා නොවේ

4. පහත සඳහන් නාට්‍ය අතරින් ලෝක ධර්මී නාට්‍යක් නොවන්නේ

   i කැලණි පාලම — iii විකෘති

   ii තල මල පිපිලා — iv සිංහබාහු

- **කෙටි පිළිතුරු සපයන්න.**
  - නාට්‍ය ධර්මී නාට්‍ය සඳහා උදාහරණ දෙකක් ලියන්න
  - නාට්‍ය ධර්මී නාට්‍ය නාට්‍යයක ලක්ෂණ තුනක් ලියන්න
  - ලෝක ධර්මී නාට්‍ය සඳහා උදාහරණ තුනක් ලියන්න
  - මිශ්‍ර ශෛලිය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද
  - ලෝක ධර්මී නාට්‍ය ශෛලිය ට අයත් විදේශීය නාට්‍ය නිර්මාණ දෙකක් ලියන්න

- **රචනා ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1. ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී නාට්‍යයන් හි දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ නිදසුන් සහිතව පැහැදිලි කරන්න
2. ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී නාට්‍ය පිළිබඳ භරතමුනිගේ විග්‍රහය විග්‍රහ කරන්න